**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2019**
---------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය
---------------------------------

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.4 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.61,157,169 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.101,561,289 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,404,120 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් 12,992,592 කින් වැඩි වී තිබුණද පුද්ගලික පඩිනඩි, ගිවිසුම්ගත සේවාවන් හා අනෙකුත් වියදම් පිලිවෙලින් රු.9,044,998 කින්, රු.14,367,183 කින් හා රු.12,500,418 කින් වැඩිවීම හා දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන ලාභය රු.21,899,972 කින් අඩුවීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වනවිට වසර 16 ක් ගත වී ඇතත් පනත සංශෝධනය කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි. එම නිසා අධිකාරියේ කාර්යයන් වර්තමානයට ගැලපෙන ආකාරයට කරගෙන යාමට නොහැකිවී තිබුණි. | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් අවසාන කෙටුම්පත 2019.08.16 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. ඉන් අනතුරුව ,නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් 2019.12. 27 දින රේඛීය | පනත සංශෝධන කටයුතු නියමිත කාලසීමාව තුල නිම කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අමාත්‍යාංශය වෙත ,ලේකම් හා රජය වෙනස්වීම හේතුවෙන් නව කැබිනට් අනුමැතියකින් යොමු කිරීමට නැවත 2020.02.03 කැබිනට් පත්‍රිකා කෙටුම්පතක් අධිකාරිය විසින් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. 2020.02.18 වන දින ගරු විෂයභාර අමාත්‍යතුමා සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර එහිදී නැවත කමිටුවක් පත්කර නව සංශෝධන සලකා බලා කටයුතු කරන ලෙස එවකට සිටි විෂය භාර අමාත්‍යතුමා විසින් උපදෙස් දී ඇත .ඒ අනුව 2020.07.28 දිනැති ලිපියෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් කමිටුවක් පත්කරමින් ලිපියක් එවා ඇත . | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ වූ ඉලක්කගත වැටලීම් ප්‍රමාණය 29,000 ක්වූ අතර එය මාසිකව එක් එක් දිස්ත්‍රික්ක සඳහා සංශෝධනය කර ඉලක්ක 26,405 දක්වා සංශෝධනය වී තිබුණි. 2017 වර්ෂයේ ඉලක්කගත වැටලීම් 27,216 ක්වූ අතර 2018 දී එය 357 කින්ද 2019 දී 454 කින්ද අඩුවී තිබුණි. ඉකුත් වර්ෂයේ අධිකාරියට විමර්ෂණ නිලධාරීන් 213 ක් අළුතෙන් බඳවාගෙන තිබියදීත් 2017 වර්ෂයට සාපේක්ෂව අඩු වැටලීම් ඉලක්කයන් ලබාදී තිබුණි. | විමර්ශන නිලධාරීන් සඳහා රාජකාරි සිදු කිරීමට ඇති වපසරිය ඉතාමත් පුළුල් අතර වැටලීම් රාජකාරි යනු එක් විෂය ක්ෂේත්‍රයක් පමණි. පාරිභෝගික හා වෙළඳපොළ දැනුවත් කිරීම, පාරිභෝගික පැමිණිලි විසඳීම, වෙළඳපොළ සමීක්ෂණ කටයුතු සිදු කිරීම, වැටලීම් හා සම්බන්ධ උසාවි රාජකාරී කටයුතු සිදු කිරීම ආදී ප්‍රධාන කාර්යයන්ට අමතරව එකී රාජකාරීන්ට අදාල ලිපිලේඛන පිලියෙල කිරිම සහ දත්ත පද්ධති යාවත්කාලීන කිරීමද ඇතැම් දිස්ත්‍රික්කවල විමර්ශන නිලධාරීන් විසින්ම සිදු කරනු | විමර්ශන නිලධාරීන්ට සාපේක්ෂව වැටලීම් ඉලක්ක සකස් විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලැබේ. කාර්යාලීය අවශ්‍යතාවය මත මෙකී රාජකාරී සඳහා නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර හුදෙක් වැටලීම් රාජකාරී සඳහා අනුයුක්ත කල නිලධාරීන් ගණන අනුව වැටලීම් ඉලක්ක සංශෝධනය වේ. එබැවින් සංශෝධිත වැටලීම් ඉලක්ක අනුව 2017 වසරට සාපේක්ෂව 2018 සහ 2019 වසර වලදී අඩු වැටලීම් ඉලක්ක ලබා දී ඇති ලෙස දැක්වේ. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් දිස්ත්‍රික්ක සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකළ යුතු ප්‍රමාණය පිළිබඳ සැලැස්මක් පිළියෙල කර නොතිබුණු නමුත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 1,538 ක් සිදුකර තිබුණි. ඉන් ජනගහනය හා වෙළඳසැල් වැඩි ඒ හා බී කාණ්ඩයේ දිස්ත්‍රික්කවලට සාපේක්ෂව ජනගහනය හා වෙළඳසැල් අඩු සී හා ඩී කාණ්ඩයේ දිස්ත්‍රික්කවල දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩියෙන් සිදුකර තිබුණි. | 2019 වසරට ඉලක්ක ලබාදී නොතිබුණද 2018 වසරට අදාලව ලබාදී තිබූ ඉලක්ක 2019 වසරට අදාලවද සැලකිල්ලට ගන්නා ලෙස, දිස්ත්‍රික් නිලධාරීන් සඳහා පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී උපදෙස් ලබාදී ඇත. එම ඉලක්ක අනුව එක් දිස්ත්‍රික්කයට 2019 වසරේ කළ යුතු දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 23 කි.<br>ජනගහනය ව්‍යාප්ත වී ඇති ආකාරය හා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම ආවරණය වන පරිදි වැඩසටහන් පැවැත්වීම පිළිබඳව නිලධාරීන්ගේ අවධානය යොමු කළ යුතුව තිබූ නමුත් එය 2018/01 අභ්‍යන්තර චක්‍ර ලේඛයේ අංක 3 වැඩසටහන් සංවිධානය නම් වූ කොටසින් වඩා පැහැදිලි කර ඇති බවත් සඳහන් කරමි. | වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කල යුතු ප්‍රමාණය පිළිබඳව සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අධිකාරියේ නීති අංශය වෙත යොමුවූ පැමිණිලි 1476 කින් පැමිණිලි 112 ක අනුකූල නොවීම සම්බන්ධව නීතිමය කටයුතු සඳහා යොමුවී තිබුණි.තවද එක් පැමිණිල්ලක් අනුකූල නොවීම සම්බන්ධව නීතිමය කටයුතු සඳහා යොමුවීමට නියමිතව තිබුණු අතර අදාල පාර්ශවකරුවන්ගෙන් ලැබිය යුතු තොරතුරු නොලැබීම මත පැමිණිලි 65 ක් නොවිසඳී තිබුණි. ඒ අනුව පැමිණිලි 492 ක විමර්ෂණ කටයුතු තවදුරටත් සිදුකළ යුතුව පැවති අතර ඉන් 2019 වර්ෂයට අදාලව පැවතියේ පැමිණිලි 136 ක් පමණි. 2015 වර්ෂයේ සිට 2018 වර්ෂයට අදාලව කාලපර්වඡේදයේ ලැබුණු පැමිණිලිවලින් 356 ක විමර්ෂණ කටයුතු තවදුරටත් සිදුකළ යුතුව පැවතුනි. | ආයතනයට ලැබෙන පැමිණිලි සම්බන්ධව පරීක්ෂණ සිදු කරනු ලබන්නේ ආයතනයේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත පරීක්ෂණ මණ්ඩලයකින් වන අතර ආයතනයේ සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලය වරින්වර කිහිපවිටක්ම වෙනස්වීම්/ නව පත්වීම් ලැබීම සහ සමහර කාලයන්වලදී දීර්ඝ කාලයක් අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොවීම යන හේතු මත විධිමත් පරීක්ෂණ කටයුතු වරින්වර අවලංගු කිරීමටත් කල් දැමීමටත් ලබාදෙන ඉදිරි දිනයන්ට පමණක් පරීක්ෂණ පැවැත්වීම කල්යාම සම්බන්ධ ලැබෙන පාරිභෝගික පැමිණිලි පිළිබඳව 2019.02.14 දිනැති අභ්‍යන්තර මැමය හරහා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුවත් කිරීමක් සිදු කර ඇත. | 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැමිණිලි 356 ක විමර්ශන කටයුතු සිදු කිරීමේදී යම් ප්‍රමාදයක් සිදු වී ඇත. |
| (ඈ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අධිකාරියේ නීති අංශය වෙත යොමුවූ පැමිණිලිවලින් පැමිණිලි 202 ක් සම්බන්ධව සිදුකළ විමර්ශන වලදී දෙපාර්ශවය සමථයකට පත් නොවීම මත වගඋත්තරකරු වෙත නියෝග නිකුත් කිරීමට පරීක්ෂණ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම පැමිණිලි 202 න් 127 ක් සඳහා නියෝග නිකුත් කර එම නියෝග අදාල පාර්ශව වෙත දන්වා තිබුණි. එසේ වුවද පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් ලබාදී තිබුණු නියෝග අදාල පාර්ශව වෙත දන්වා නොතිබුණු අතර පැමිණිලි 55 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලය විසින් විගණිත දින වන විටත් නියෝග නිකුත් කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දින වන විට නියෝග නිකුත් කිරීමට තීරණය කළ පැමිණිලි 185ක් වූ අතර ඉන් පැමිණිලි 140 කට අදාළ නියෝග අදාළ පාර්ශව කරුවන් වෙත යොමු කර ඇත .තවත් ලිපි ගොනු 30කට අදාලව නැවත විධිමත් පරීක්ෂණ කටයුතු අරඹා ඇති අතර මේ වන විට පාර්ශව වෙත යොමු කර නොමැති ලිපිගොනු ඇත්තේ 14ක් පමණි. | පැමිණිලිවලට ලබාදෙන නියෝග ප්‍රමාදයකින් තොරව අදාල පාර්ශවකරුවන් වෙත දැන්වීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2003 අංක 09 දරන පාරිභෝගික පිළිබඳ අධිකාරී පනතේ 13(4) වගන්තිය ප්‍රකාරව අධිකාරිය වෙත ලැබෙන පැමිණිල්ලක් විභාග කිරීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි අතෘප්තියට පත් පාර්ශවයට වන්දි ගෙවන ලෙස හෝ යම් භාණ්ඩ ප්‍රතියෝජනය කරන ලෙස හෝ ඒ භාණ්ඩ සඳහා නැතහොත් සේවය සැපයීම සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවන ලෙස අධිකාරිය විසින් ඒ සාදන්නාට හෝ වෙළෙන්දාට ලිඛිත ලියවිල්ලකින් නියම කළ යුතුය. එසේ වුවද, පරීක්ෂා කළ විමර්ෂණ ලිපිගොනු 08 කට අදාලව 2017, 2018 හා 2019 වර්ෂවලදී පැමිණිලිකාර පාර්ශවය වෙත එකතුව රු.717,993 ක්වූ වන්දියක් ගෙවන ලෙස වගඋත්තරකරුවන් වෙත නියම කර තිබුණි. එම නියෝග විගණිත දින වන විටත් අදාල පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ අත්සන් නොතිබීම හේතුවෙන් ලිපිගොනු 06 ක ලබාදී තිබුණු නියෝග අදාල පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මෙයට අදාළ ලිපි ගොනු 12කට අදාළ නියෝග මේ වන විටත් ධුරයෙන් ඉවත්ව ගිය පූර්ණ කාලීන සාමාජිකයන් දෙදෙනෙකුගේ අත්සන ලබා ගැනීම සඳහා යොමු කර ඇත .නමුත් මේ වනතෙක් ඔවුන්ගේ අත්සන් නොලැබීම මත ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර ගැනීම පිළිබඳව අවධානය යොමුකර ඇත . එසේම තවත් නියෝග 2ක් සඳහා 2020වසරේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත .ඒ අනුව ඉදිරි දිනකදී මෙම නියෝගයන් අදාළ පාර්ශව වෙත ලබා දීමට නියමිත වේ .තවත් එක් නියෝගයක් 2020 ජූලි මස අදාළ පාර්ශව කරුවන් වෙත ඉදිරිපත් කර ඇත. | කඩිනමින් පරීක්ෂණ මණ්ඩලය විසින් අදාල නියෝග අත්සන් කර අදාල පාර්ශවකරුවන් වෙත දැන්වීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි විමර්ෂණ කටයුතු සඳහා යොමු කිරීමෙන් පසු විමර්ෂණ කටයුතු සඳහා විශාල කාලයක් ගත වන අතර සාකච්ඡා හෝ පරීක්ෂණ වාර දෙකක් අතර මාස 06 ක් ඉක්මවන කාලයක් ගතවී තිබුණි. පැමිණිලිකරු, වගඋත්තරකරු හා අධිකාරියේ නිලධාරීන් විශාල කාලයක් කැප කරමින් පරීක්ෂණ කටයුතු සිදු කර තිබුණද පරීක්ෂණයේදී නිකුත් කළ නියෝග පරීක්ෂණ මණ්ඩලය විසින් අත්සන් නොකිරීම හා අදාල පාර්ශව වෙත දැනුම් නොදීම මත එම නියෝග ලිපිගොනුවලට පමණක් සීමාවී තිබුණු බැවින් 2003 අංක 09 දරන පාරිභෝගික | මෙයට අදාළ ලිපි ගොනු 12කට අදාළ නියෝග මේ වන විටත් ධුරයෙන් ඉවත්ව ගිය පූර්ණ කාලීන සාමාජිකයන් දෙදෙනෙකුගේ අත්සන ලබා ගැනීම සඳහා යොමු කර ඇත .නමුත් මේ වනතෙක් ඔවුන්ගේ අත්සන් නොලැබීම මත ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි පියවර ගැනීම පිළිබඳව අවධානය යොමුකර ඇත . එසේම තවත් නියෝග 2ක් සඳහා 2020වසරේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත .ඒ අනුව ඉදිරි දිනකදී මෙම නියෝගයන් අදාළ පාර්ශව වෙත ලබා දීමට | කඩිනමින් පරීක්ෂණ මණ්ඩලය විසින් අදාල නියෝග අත්සන් කර අදාල පාර්ශවකරුවන් වෙත දැන්වීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධිකාරී පනතේ 13(5) හා 13(6) වගන්ති ප්‍රකාරව කටයුතු ඉටු කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | නියමිත වේ .තවත් එක් නියෝගයක් 2020 ජූලි මස අදාළ පාර්ශව කරුවන් වෙත ඉදිරිපත් කර ඇත. | |
| (උ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ 8 (ඌ) වගන්තිය අනුව වෙළඳපොළ තත්ත්ව සහ පාරිභෝගික කටයුතුවලට අදාළව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම, අධිකාරියේ එක් කාර්යයක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් සිදු කරන ලද වෙළඳපොළ අධ්‍යයනවලට අදාළව සමාලෝචිත වර්ෂයේදි වාර්තා 5 ක් නිකුත් කර තිබුණි. ඉන් ආහාරයට සුදුසු තෙල් සම්බන්ධව සිදු කළ වෙළඳපොළ අධ්‍යයනයේදී හඳුනාගෙන තිබුණු පාරිභෝගික ආරක්ෂාවට හා සෞඛ්‍ය තත්ත්වයට හානිවන කරුණු සම්බන්ධයෙන් අධිකාරියේ අවධානය යොමු කර එම තොරතුරු මහජනතාව වෙත දැනුම් දීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන වලදී හඳුනාගන්නා ලද ගැටළු පාරිභෝගික ආරක්ෂාවට හා සෞඛ්‍යය තත්ත්වයට හානිවන කරුණු බැව් අධිකාරිය විසින් හඳුනාගත් හෙයින් ඒ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. එනම්,<br>2016 වර්ෂයේදී සමස්ත දිවයිනම ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් 1538 ක් පුද්ගලයින් 124,082 ක් සහභාගීත්වයෙන් පවත්වා තිබීම<br>පොල්තෙල් ඇසුරුම් කර ලේබල් සහිතව වෙළඳපලට නිකුත් කිරීමේදී ඇසුරුමෙහි තිබිය යුතු ප්‍රමිතිය සහ ලේබලයේ තිබිය යුතු කරුණු පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ පොල් සංවර්ධන අධිකාරිය එක්ව සිදු කිරීම මෙමගින් පාරිභෝගියින්ට ගුණාත්මක මට්ටමේ වඩාත් සෞඛ්‍යදායි පොල්තෙල් වර්ගයක් තෝරා ගැනීමට හැකිවීම<br>පාරිභෝගිකයා නොමග යවමින් සෞඛ්‍යට හානිදායී වන ආකාරයෙන් ආහාර පිසීම සඳහා යොදාගන්නා තෙල් වර්ග අලෙවි කරනු ලැබූ වෙළෙන්දන්ට එරෙහිව වැටලීම් සිදු කිරීම සහ නඩු පැවරීම හා ඒ පිළිබඳ වෙළඳුන් දැනුවත් කිරීම 2019 වර්ෂයට අදාළව පැමිණිලිවලට අදාළව ෆාම් | වෙළඳපල අධ්‍යයන වලදී හඳුනාගත් තොරතුරු මහජනතාව වෙත දැන්වත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තෙල් සහ පොල්තෙල් සම්බන්ධව නියැදි පරීක්ෂාවන් සිදු කිරීම | |
| (ඌ) | සිමෙන්ති බ්ලොක්ගල් සහ වානේ කම්බි පිළිබඳ සිදු කළ අධ්‍යයන වලදී හඳුනාගත් ගැටළු හා එම ගැටළු විසඳීමට ඉදිරිපත් කල යෝජනා ඇතුළත් වාර්තාවන් අමාත්‍යංශයට යොමු කිරීම පමණක් සිදු කර තිබුණු අතර එම තොරතුරු මහජනතාවට සැපයීම හෝ මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආයතන දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සිමෙන්ති බ්ලොක්ගල් සහ වානේ කම්බි පිළිබඳ සිදු කළ අධ්‍යයන වලදී හඳුනාගත් ගැටළු හා එම ගැටළු විසඳීමට ඉදිරිපත් කල යෝජනා ඇතුළත් වාර්තාවන් අමාත්‍යංශයේ ඉල්ලීම පරිදි අමාත්‍යංශයට යොමු කරන ලද අතර එම අධ්‍යනයේදී හෙළි වූ ඇතැම් කරුණු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සුදුසු බව නිරීක්ෂණය විය. | වෙළඳපල අධ්‍යයන වලදී හඳුනාගත් තොරතුරු මහජනතාව වෙත දැනුවත් කිරීමට කටයුතු කල යුතුය. |